# හදිසි අවස්ථාවකදී, Triple Zero (000) අමතන්න

හදිසි අවස්ථාවකදී පොලීසිය, ගිනි නිවන රථ හෝ ගිලන් රථ හා සම්බන්ධවීම සඳහා ඕස්ට්‍රේලියාවේ ඕනෑම දුරකථනයකින් Triple Zero (000) අමතන්න. මෙම ඇමතුම් සඳහා ගාස්තු අය නොකෙරේ.



# 000

# EMERGENCY



®

**Triple Zero (000) ඇමතිය යුතු අවස්ථා**

ඔබ විසින් Triple Zero (000) ඇමතිය යුතු වන්නේ පොලීසිය, ගිනි නිවන රථ හෝ ගිලන් රථ මගින් හදිසි ප්‍රතිචාරයක් අවශ්‍ය ජීවිත තර්ජන හෝ දරුණු ලෙස කාලය සීමාකාරී අවස්ථාවක පමණි.

**මා විසින් Triple Zero (000) ඇමතූ පසු කුමක් සිදුවේද?**

දුරකථන ක්‍රියාකරන අය විසින් ඔබට අවශ්‍ය - පොලිස්, ගිනි නිවන හෝ ගිලන් රථ ද - යන්න විමසන අතර අදාල අය සමග ඔබව සම්බන්ධ කරදෙනු ඇත. දුරකථන ක්‍රියාකරන අය විසින් ඔබ ඇමතීම කරන්නේ කොහේ සිටද යන්නද විමසිය හැකිවේ.

**මා හට ඉංග්‍රීසි කථා කිරීමේ අපහසුතාවයක් ඇතිනම් කුමක් සිදුවේද?**

ඔබ හට ඉංග්‍රීසි කථා කිරීමේ අපහසුතාවයක් ඇතිනම්, ඔබ විසින් ඉල්ලා සිටින ලද හදිසි සේවාව වෙත ඔබ සම්බන්ධ කල පසු භාෂා පරිවර්තකයෙකු ඉල්ලා සිටිය හැකිවේ. භාෂා පරිවර්තකයා හට ඔබ විසින් ගෙවිය යුතු නොවේ.

**ඔබ Triple Zero (000) අමතන විට, කලබල නොවී, දුරකථන මාර්ගයේ රැඳීසිට දුරකථන ක්‍රියාකරන අයගේ ප්‍රශ්නවලට පැහැදිලිව පිළිතුරු ලබාදෙන්න.**